


dra Gallage/ICRC

## මානුෂවාදී ප්‍රතිපත්තිවලට ගරු කිරීම ප්‍රවර්ධනය

පහත සදහන් ක්‍රියා මාර්ග මගින් අයි.සී.ආර්.සී. වසර ගණනාවක සිට අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කොට ඇත.

- ජාතික බලධාරීන්ට, ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවලට සහ අධ්‍යාපන විද්වතුන්ට ඔවුන් ගේ පුහුණු කිරීම්වලට සහ විෂයමාලාවන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතියේ මූලධර්ම ඒකාබද්ධ කිරීමට ආධාර සැපයීමෙන්.
- මෙම ආයතනවල සාමාජිකයන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ සමුළුවලට, වැඩමුළුවලට සහ එතෙර පැවැත්වෙන සම්මන්ත්‍රණවලට සහභාගිවී අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වර්ධනය කරගැනීමට අනුග්‍රහය දැක්වීමෙන්.
- වාර්ෂික වාද උසාවි තරඟ සංවිධානය කොට නීතිය හදාරණ උපාධි අපේක්ෂකයන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතිය ගැන ගැඹුරු දැනුමක් ලබාදීමෙන්.
- එක්සත් ජාතීන් ගේ සාමසාධක හමුදාවලට දායකවන රටක් ලෙස ශ්‍රී ලංකාව ඉටු කරන කාර්ය භාරය සැලකිල්ලට ගනිමින් විදේශවල සාමසාධක මෙහෙවරෙහි යෙදෙන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ දැනුවත් කිරීමෙන්.

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමග සහයෝගයෙන් වැඩකිරීම

අයි.සී.ආර්.සී. එහි ජාතික රතුකුරුස සහ රතු අඩසඳ සංවිධානයේ හවුල්කරු වන ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ක්‍රියාත්මක කරන, අතීතයේ පැවති ගැටුමෙන් හෝ ස්වාභාවික ආපදාවලින් වෙන්කෙරුණු පවුල් සාමාජිකයන් සමග යළි පවුල් සබඳතා පිහිටුවීමේ වැඩසටහනට මූල්‍ය, තාක්ෂණ සහ භෞතික ආධාර සපයයි. එම සමාජය මෙහෙයවන මූලික මානුෂවාදී ප්‍රතිපත්ති සහ අගයන් ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය, ප්‍රථමාධාර, පුද්ගලයන් සෙවීම හා ජීවිත බේරා ගැනීම සහ කඩිනම් තක්සේරු වැනි අංශවල ස්වේච්ඡා සේවකයන්ට හදිසි ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාවන් දියුණු කිරීමට ද ආධාර කරන අයි.සී.ආර්.සී., ගතවූ පස් වසර තුළ ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට එහි කිලිනොච්චිය සහ මුලතිව් ශාඛා නැවත පිහිටුවීමට ද ආධාර කරමින් සිටී.

## මෙහෙවර

අපක්ෂපාතී මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයක් වන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සුවිශේෂී මානුෂවාදී මෙහෙවර වන්නේ සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හි වින්දිතයන් ගේ ජීවිත සහ ගරුත්වය ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ආධාර සැපයීමයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ විශ්ව මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කරමින් සහ ශක්තිමත් කරමින් මිනිසුන්ගේ දුක්වේදනා නිවාරණයටද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රයත්න දරයි. 1863 දී පිහිටුවන ලද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ජිනීවා සම්මුති සහ අන්තර් ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ මුල් සංවිධානයයි. මෙම කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හිදී මෙම සංවිධානය ඉටු කරන අන්තර්ජාතික කාර්යයන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කරයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
29, ලෙයාඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථන : +94 (11) 250 33 46 ෆැක්ස් +94 (11) 250 33 48
ඊමේල් : colombo@icrc.org www.icrc.org

70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
ශ්‍රී ලංකාව
දුරකථන : +94 (0) 24 222 28 55 ෆැක්ස් +94 (0) 24 222 25 37

ICRC

2015.0117/259 10.2015 2000



Tuan Zaharan/ICRC

# ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව

ICRC

ලුහුඬින්



## අපගේ ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයි.සී.ආර්.සී.) 1989 සිට ශ්‍රී ලංකාවේ සේවාවන් ඉටු කරමින් සිටී. ආරම්භයේදී මෙම සංවිධානය දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීමෙන් සහ ඉන්පසුව ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය අතර උතුරු නැගෙනහිර පැවති ගැටුමේ ප්‍රතිඵල ලෙස ඇතිවූ මානුෂවාදී අවශ්‍යතාවලටත් ප්‍රතිචාර දැක්වීය.

දැන්, අයි.සී.ආර්.සී. ශ්‍රී ලංකාවේ කළින් පැවති යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ ඉතිරිව පවතින මානුෂවාදී අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වයි. අදාල බලධාරීන් සමග එක්ව, පීඩාවට ගොදුරු වූ පවුල්වලට හා ප්‍රජාවන්ට ජීවනෝපායන් සඳහා ආධාර සහ ජලය හා සනීපාරක්ෂක පහසුකම් සලසයි. අතුරුදහන්වූවන්ගේ පවුල්වල, ඔවුන්ගේ අතුරුදහන් ඥාතීන් ගේ ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීම ඇතුලු විවිධාකාර අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට මෙම සංවිධානය දායක වෙයි.

රටෙහි සියලුම රැඳවියන්ට හොඳින් සැලකීමට සහ හොඳ රැඳවුම් තත්වයන් ලබාදීමට වගබලා ගැනීම පිණිස අයි.සී.ආර්.සී. බන්ධනාගාර අධිකාරීන්ටත් උපකාර කරයි. පවතින බන්ධනාගාර කළමනාකරණ පද්ධතිය දියුණු කිරීමට සහාය දක්වන මෙම සංවිධානය, අධිකරණ වෛද්‍ය ආයතනවලට සහ බලධාරීන්ට ඔවුන් ගේ තාක්ෂණික අධිකරණ වෛද්‍ය කුසලතා වර්ධනය කරගනිමින් මියගිය පුද්ගලයන්ගේ සහ ජීවත්වන පුද්ගලයන්ගේ ගරුත්වය සුරැකීම පිණිස ආධාර කරයි.

අයි.සී.ආර්.සී. විද්වතුන් සහ ජාතික බලධාරීන්, සිවිල් සමාජය සහ ආරක්ෂක හමුදා සාමාජිකයන් අතර අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කරයි. අයි.සී.ආර්.සී., ශ්‍රී ලංකා පොලීසියේ ත්‍රස්ත විමර්ෂන කොට්ඨාසය, අපරාධ විමර්ෂන දෙපාර්තමේන්තුව සහ මත් ද්‍රව්‍ය කාර්යංශය සඳහා බලය සහ ගිනිඅවි නිවැරදි ලෙස භාවිතය සහ පිරික්සුම් හා අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාපටිපාටියේ අන්තර්ජාතික සම්මතයන් යන ක්ෂේත්‍රවල අන්තර් ජාතික මානව හිමිකම් නීතිය ගැන පුහුණුව ලබා දෙයි.

මානුෂවාදී අගයන් ප්‍රවර්ධනය කිරීමට සහ ගැටුම පැවති ප්‍රදේශවල ජීවනෝපාය ආධාර කටයුතු ක්‍රියාත්මක කිරීමට මෙම සංවිධානය ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර ලබාදෙමින් එම සමාජය සමග සහයෝගයෙන් ක්‍රියා කරයි.
















## රැඳවුම් මධ්‍යස්ථානවල සිටින සිරකරුවන්ගේ සුබසාධනය සහතික කිරීම පිණිස බලධාරීන්ට ආධාර කිරීම

ප්‍රමාණවත් රැඳවුම් තත්වයන් සහ සියලුම රැඳවියන්ට සැලකීම සහ රැඳවියන්ට තමන් ගේ පවුල් සමග සබඳතා පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් වගබලා ගැනීම පිණිස, පුද්ගලයන් රඳවාගැනීම් බාර බලධාරීන් දරන ප්‍රයත්නයන්ට ආධාර කිරීම පිණිස, ජගත් මානුෂවාදී වරය අනුව ක්‍රියාත්මක වෙමින්, අයි.සී.ආර්.සී. 1989 සිට ශ්‍රී ලංකාවේ පුද්ගලයන් රඳවා ගෙන සිටින ස්ථාන බැලීමට යයි. තම සංචාරවලින් පසුව අයි.සී.ආර්.සී. තමන් සොයා ගත් කරුණු ඇතිනම් ඒවා සහ තම නිර්දේශ ද්විපාර්ශවීය සහ රහස්‍ය පදනමින් බලධාරීන් සමග බෙදා ගනී. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අයි.සී.ආර්.සී.:

- සාමාන්‍ය භෞතික රැඳවුම් තත්වයන්, සියලුම රැඳවියන්ට සැලකීම සහ අධීක්ෂණය තක්සේරු කරයි;
- බන්ධනාගාරවල තදබදය ආමන්ත්‍රණය කිරීම පිණිස ක්‍රියා මාර්ග සැකසීම සඳහා අදාල බලධාරීන් සමග වැඩකරයි;
- රැඳවියන්ට ප්‍රමාණවත් අයුරින් සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමට බලධාරීන් දරන ප්‍රයත්නයට ආධාර කරයි;
- රැඳවියන්ට තමන් ගේ පවුල් සමග සබඳතා පවත්වා ගෙන යාමට උපකාර කරයි;
- කුඩා පරිමාණ යටිතළ පහසුකම් අලුත්වැඩියා කිරීමට හෝ ඉදිකිරීමට දායකවෙයි. (උදාහරණ: මුලුතැන් ගෙවල්, වහල සෙවිලි කිරීම සහ වැසිකිලි, සූර්ය බලශක්ති පනේල සහ/හෝ උඩ සවිකරන වතුර ටැංකි සවිකිරීම සහ වාතාශ්‍රය ලැබීම දියුණු කිරීම); සහ
- මූලික ස්වස්ථතා ද්‍රව්‍ය, රෙදි, මෙට්ට සහ විනෝදය පිණිස අවශ්‍ය භාණ්ඩ බෙදා දෙයි.

## අතුරුදහන්වූවන්ගේ පවුල්වල මානුෂවාදී අවශ්‍යතා සපුරාලීමට සහභාගිවීම

ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති ගැටුම හා සම්බන්ධව ස්වකීය ප්‍රියාදරයන් අතුරුදහන්වූ පවුල් දහස් ගණනක් 1990 සිට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට කරුණු දන්වා ඇත. අයි.සී.ආර්.සී. ඊට ලැබී ඇති වරය යටතේ, ලෝක ව්‍යාප්තව ලබා ඇති අත්දැකීම් අනුව, මෙම පවුල්වල විවිධාකාර අවශ්‍යතා ගැටුමෙන් පසුව දීර්ඝ කාලයක් ඉතිරිව පවතින බව දන්නා හෙයින්, එම ගැටලු සඳහා අවශ්‍යව ඇති සවිස්තරාත්මක ප්‍රතිචාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බලධාරීන් සමග නිත්‍ය සංවාදයක් ස්ථාවනය කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල විශේෂ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් වඩාත් හොඳ අවබෝධයක් ලබා ගැනීමට, 2014 නොවැම්බර් සහ 2015 ජූලි මාසය අතරදී දීප ව්‍යාප්ත තක්සේරුවක් කරන ලද අතර ඉන්පසුව මෙම පවුල් වෙනුවෙන් ගැනීමට අවශ්‍යව ඇති ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අයි.සී.ආර්.සී. එහිදී සොයා ගත් කරුණු සහ නිර්දේශ අදාල බලධාරීන් සමග බෙදා ගනී.

රටේ උතුරු, මධ්‍යම සහ නැගෙනහිර පළාත්වල අතුරුදහන්වූවන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට වැඩසටහනක් සැලසුම් කොට ඇත. දේශීය බලධාරීන් සහ සංවිධාන සමග හවුල්කාරිත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

## මියගිය සහ ජීවත්ව සිටින පුද්ගලයන්ගේ ගරුත්වය සුරැකීම පිණිස අධිකරණ වෛද්‍ය ආයතනවලට සහ බලධාරීන්ට සහය වීම

සන්නද්ධ ගැටුමකදී, ආපදාවලදී (ස්වාභාවික සහ මිනිසා විසින් ඇති කරන ලද) සහ සංක්‍රමණයේදී මියයන පුද්ගලයන්ගේ මළසිරුරු, ගරුත්වයෙන් යුතුව මෙහෙයවීම සහ වෘත්තීයමය ලෙස කළමනාකරණය කිරීම ගැන වගබලා ගැනීම පිණිස අයි.සී.ආර්.සී. ක්‍රියා කරයි. එසේම මෙම සංවිධානය ජීවත්ව සිටින පුද්ගලයන් සම්බන්ධ වෛද්‍ය-නෛතික ගැටලු පිලිබඳව දේශීය ආයතනවලට උපදෙස් සපයයි.

ශ්‍රී ලංකාවේදී, අයි.සී.ආර්.සී. අධිකරණ වෛද්‍ය ප්‍රජාවට විශේෂයෙන් මිනිස් මළ සිරුරු ආපසු ලබා ගැනීම, විශ්ලේෂණය සහ හඳුනා ගැනීමට අදාල සිය තාක්ෂණ අධිකරණ වෛද්‍ය කුසලතා වර්ධනය කරගැනීමට සහය දෙයි. එසේම මෙම සංවිධානය අධිකරණ වෛද්‍ය ප්‍රජාවට සහ වෙනත් අදාල පාර්ශවකරුවන්ට පහත දැක්වෙන ආකාරයේ ප්‍රතිපත්ති මට්ටමේ ගැටලුවලට අදාල කරුණු සංවර්ධනයට සහ විධිමත් කරගැනීමටද ආධාර සපයයි:

- ආපදාවකින් පසු මියගිය පුද්ගලයන්ගේ සිරුරු කළමනාකරණය සහ සමූහ මිනීවළවල් කළමනාකරණය පිළිබඳ පරිපාලන සම්මත කාරක ක්‍රියාපටිපාටියේ මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීමේ සහ අවසන් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම;
- මරණ පරීක්ෂණ පැවැත්වීමට අදාල නීති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් සංශෝධනය කිරීමේ ක්‍රියාවලියට දායකවීම;
- රැඳවුම් මධ්‍යස්ථානවල වෛද්‍ය-නෛතික ගැටලු ආමන්ත්‍රණය කිරීම.

## පීඩාවන්ට ගොදුරුවූ පවුල්වලට සහ ප්‍රජාවන්ට ජීවනෝපාය ආධාර

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල කාන්තාවන් ගෘහමූලිකත්වය දරන පවුල්වලට, අතීතයේදී ගැටුම නිසා ආබාධිත වූ තැනැත්තන්ට, පුනරුත්ථාපනය කොට නිදහස් කරන ලද පුද්ගලයන්ට, දැඩිලෙස පීඩාවන්ට ගොදුරුවීමේ අවදානමේ පසුවන පවුල්වලට සහ පුද්ගලයන් අතුරුදහන් වූ පවුල්වලට, ක්ෂුද්‍ර ආර්ථික මූලාරම්භ වැඩසටහනින් ජීවනෝපාය උදෙසා වැඩකටයුත්තක් ඇරඹීමට හෝ ඇති එවන්නක් ස්ථාවර කරගැනීමට අයි.සී.ආර්.සී. ආධාර සපයයි. බෝග වගාව, ධීවර, සත්ව පාලනය, වෙළඳාම, අත්කම් භාණ්ඩ නිෂ්පාදනය වැනි කාර්යයක නියැලීමෙන් මෙම ප්‍රතිලාභීන්ට තමන්ට සහ තම පවුල්වලට තිරසාර ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකිවෙයි. අංශයක විශේෂිත අවශ්‍යතා සපුරාලීමට සැලසුම් කළ ප්‍රජා මූල ජීවනෝපාය ආධාර වැඩසටහන මගින් නැවත පදිංචිය පිණිස පැමිණි පවුල් ඇතුලු උතුරේ පීඩාවට පත් ප්‍රජාවන්ගේ ජීවනෝපායන් දියුණු කිරීමට අයි.සී.ආර්.සී. වැඩ කරයි.

## සුරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව සඳහා ඇති ප්‍රවේශය දියුණු කිරීම

කනින ලද විවෘත ළිං පිලිසකර කිරීමෙන් හා ඉදිකිරීමෙන් සහ අත්පොම්ප අලුත්වැඩියා කිරීමෙන් කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වව්නියාව යන දිස්ත්‍රික්කවල සිවිල් ජනතාවට ප්‍රතිලාභ අත්වෙමින් පවතින අතර ඔවුන්ගේ පාසල්වලට ජල සම්පාදන ක්‍රම සහ සනිපාරක්ෂක පහසුකම් ලබාදීම නිසා ළමයි ප්‍රතිලාභ ලබති.